බෞද්ධ සමාජයට එරෙහිව වෛරී ප්‍රකාශයක් කළේය යන චෝදනාව මත, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) පනත යටතේ අත්අඩංගුවට ගෙන, මසක පමණ කාලයක් රිමාන්ඩ් භාරයේ රඳවා තබාගෙන සිටි නතාෂා එදිරිසූරියට මහාධිකරණයෙන් ජූලි 05, 2023 දින ඇප නියම වුණි. එහිදී මහේස්ත්‍රාත්වරයා ප්‍රකාශ කර සිටියේ, ඇගේ සමස්ත ප්‍රකාශනය ගත් විට බැලූ බැල්මට එය වෛරී ප්‍රකාශයක් ලෙසින් පෙනී නොයන නිසා ඇප නියම කරන බවයි.

මේ සම්බන්ධයෙන් මාධ්‍ය තුළ ද අවධානය යොමුවී තිබිණි. කෙසේ නමුත් එම පුවත වාතර්ා කරන දිවයින පුවත්පත එය පෙන්වා ඇත්තේ මෙසේය:

සිරස්තලය: "කොටුවෙන් රිමාන්ඩ් කළ නතාෂාට මහාධිකරණයෙන් ඇප"
උපසිරස්තලය: "ඇය මානසික රෝගයකට බෙහෙත් අරන්, නි.සොලිසිටර් ජනරාල් කියයි"
උපසිරස්තලය: "වෙච්ච වරදට සමාව ගන්න ඇය සූදානම්, නතාෂාගේ නීතිඥ"

1) දිවයින සිරස්තලය හා උපසිරස්තල ඔස්සේ, නතාෂා එදිරිසූරියට ඇප නියම වී ඇත්තේ ඇය "මානසික රෝගයකට බෙහෙත් ගැනීම" සහ "වෙච්ච වරදට සමාව ගන්නට සූදානම් වීම" නිසා යැයි නොහැඟවෙන්නේ ද?

2) සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) පනත යටතේ ආගමික නායකයෙකු හෝ පෙළඹවීමේ බලයක් ඇති අයෙකු පැමිණිල්ලක් කළ පමණින්ම යමකු අත්අඩංගුවට ගැනීම යුතු නොවන බවටත්, නතාෂාගේ සමස්ත ප්‍රකාශනය ගත් විට බැලූ බැල්මට එය වෛරී ප්‍රකාශයක් ලෙසින් පෙනී නොයන නිසා ඇප නියම කරන බවටත් මහාධිකරණ මහේස්ත්‍රාත්වරයා පැවසීම, දිවයින සිරස්තල ඔස්සේ සැඟව නොයන්නේද?

3) එසේනම් දිවයින සිරස්තල තුළින් නතාෂාට ඇප ලැබීමේ ස්වභාවය සම්බන්ධයෙන් පාඨකයා නොමඟ හැරීමක් සිදු නොවන්නේද? එය නිරවද්‍ය භාවය සම්බන්ධ මාධ්‍ය ආචාර ධමර් කඩ කිරීමක් ද නොවන්නේ ද?

4) එසේම නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් පවසන අන්දමට නතාශාගේ "මානසික රෝගී තත්වය" ඇයට ඇප ලබාදීමට අදාළ නොවන පසුබිමක, එය දිවයින විසින් ඉස්මතු කොට දැක්වීම කෙතරම් ආචාරධාමරීක ද ?

මූලාශ්‍ර:
https://www.newswire.lk/.../natasha-edirisooriya-case.../

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර් කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!